# ශ්‍රී ලංකාවේ පුරාසික යුගය (භූ ගවේෂණ)

**විෂයය** : සිංහල භාෂාව හා සාහිත්‍යය

**ශ්‍රේණිය** : 11

**වාරය** : තුන්වන වාරය

**නිපුණතාව** : **10.0** සාහිත්‍යික, දාර්ශනික, විද්‍යාත්මක හා තාක්ෂණික තොරතුරු ඇතුළත් නිර්මාණ පරිශීලනයෙන් ලබා ගන්නා දැනුම විවිධ භාෂා කාර්යයන් සඳහා යොදා ගනියි.

**නිපුණතා මට්ටම** : **10.2** දැනුම ලබා ගැනීම සඳහා විද්‍යාත්මක හා තාක්ෂණික තොරතුරු ඇතුළත් පොත පත පරිශීලනය කරයි.

**ඉගෙනුම් පල** :
- පොත පත පරිශීලනයෙන් ලබා ගත් තොරතුරු ඉදිරිපත් කරයි.
- පාරිභාෂික වචනවල අර්ථ පැහැදිලි කිරීමට යොමු වෙයි.
- පාරිභාෂික වචන අර්ථවත් ව භාවිත කරයි.
- විද්‍යාත්මක හා තාක්ෂණික තොරතුරු ඇතුළත් වෙනත් පොත පත කියවීමට පෙලඹෙයි.

## ක්‍රියාකාරකම් 1

1) පුරාසික යුගය වශයෙන් සැලකෙන කාලය කුමක් ද ?
2) පුරාසික ෆොසිල මේ කාලයේ හමු වී ඇති රටවල් හා ප්‍රදේශ මොනවා ද ?
3) මේ අවධියේ පරිණාමයට පත්ව ඇති ක්ෂීරපායී සතුන් නම් කරන්න.
4) ශ්‍රී ලංකාවේ පුරාසික තැම්පතු ආකාර තුනක් ලෙස ඇත්තේ කොහි ද ?
5) තබ්බෝව පුරාසික තැන්පතුව පිළිබඳව මුල් ම වාර්තා කිරීම් කළේ කවුරුන් ද ?
6) තබ්බෝව වැව අසල හමු වූ තැන්පතු සමග තිබූ පාෂාණ වර්ග මොනවා ද ?
7) තබ්බෝව තැන්පතුවලින් හමු වූ ශාක විශේෂ සමාන වූයේ කුමන ශාක සමග ද ?

8) ක්‍රි. ව. 1966 සහ 1969 වසරවල කරන ලද පර්යේෂණවලින් ලැබුණු තැන්පතු මොනවා ද ?

9) මෙම තැන්පතු අයත් අවධිය කුමක් දැයි දක්වන්න.

10) ශ්‍රී ලංකාවේ භූ විද්‍යා තොරතුරු ප්‍රකාශයට පත් කළ වසර කුමක් ද ?

11) කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රථම ශ්‍රී ලාංකික අධ්‍යක්ෂ වූයේ කවුද ?

12) එතුමා විසින් රචිත ලිපි මොනවා ද ?

13) ආඬිගම තැන්පතුවට සමාන ඉන්දියාවේ තැන්පතුව කුමක් ද ?

14) 1944 ලංකාවේ "ජුරාසික පොසිල" පිළිබඳව ශාස්ත්‍රීය ලිපි සම්පාදනය කළ අය නම් කරන්න.

15) 1942 දී එතුමා විසින් රචිත ශාස්ත්‍රීය ලිපිය කුමක් ද ?



තබ්බෝව තැන්පතුවෙන් හමු වූ ශාක ෆොසිලයක්



තබ්බෝව වැව, මෙහි පෙනෙන ගල්, ජුරාසික යුගයේ තැන්පත් වූ අවසාදිත ය.









පුරාසික යුගය පැවති ආකාරය අනුමාන කෙරෙන සිතුවමක්

## ක්‍රියාකාරකම් 2

1) පහත සඳහන් තනිපද හා ගැළපෙන අදහස තෝරා එහි අක්ෂරය ලියන්න.

| තනිපදය | අක්ෂරය |
|---|---|
| i. නීතිගරුක | |
| ii. කවන්දය | |
| iii. චිකිත්සාගාරය | |
| iv. අතිශයෝක්ති | |
| v. පශ්චාත්තාපය | |
| vi. අදූරදර්ශී | |
| vii. ආරෝහපරිනාහ | |
| viii. මනකඃකල්පිත | |
| ix. අසාධ්‍ය | |
| x. නිරෝධායනය | |

| අදහස |
|---|
| A. කළ වරද ගැන කනගාටු වීම. |
| B. පමණ ඉක්මවා යාම. |
| C. නීතියට ගරුකරන |
| D. උසට ගැළපෙන මහත |
| E. ප්‍රතිකාර කරන කාමරය |
| F. හිස නැති මළ කඳ |
| G. දුර දිග බලා ක්‍රියා කරන |
| H. රෝගයක් ඇත්දැයි දැන ගැනීමට කාලයක් වෙන්කොට තැබීම. |
| I. සුවකළ නොහැකි |
| J. සිතින් මවා ගත් |
| K. දුර දිග බලා ක්‍රියා නොකරන |

2) A හා B තීරුවල ඇති ලක්ෂණයට හා උදාහරණයට ගැළපෙන පාරිභාෂික වචනය තෝරා හිස්තැනෙහි ලියන්න.

| ලක්ෂණය | උදාහරණය | වචනය |
|---|---|---|
| i. රළු කණිකාමය පාෂාණ | තිරුවානා, ඕර්තොක්ලෙස්, ෆෙල්ඩ්පාර් හා මයිකා | ................................ |
| ii. අතීතයේ පැවති අති විශාල භූමි ප්‍රදේශ | ඉන්දියාව, ඕස්ට්‍රේලියාව, ඇන්ටාක්ටිකාව, අප්‍රිකාව, මැඩගස්කරය, දකුණු ඇමරිකාව ආදී ප්‍රදේශ | ................................ |

| | | |
|---|---|---|
| iii. අස්ථිවලින් සැදුම්ලත් සැකිලි පද්ධතියක් දරන මසුන් | තෝරා, පරවා, බලයා | ............................... |
| iv. කොඳු ඇට පෙළක් දරන සතුන් | ක්ෂීරපායීන්, පක්ෂීන්, උරගුන්, මසුන් හා උභය ජීවීන් | ............................... |
| v. සෛල කිහිපයක් හෝ සෛල රාශියකින් සැදුම්ලත් සිරුරු දරන ජීවීන් | ගැඩවිලා, කපුටා, ඕලු ගස, ගස්ලබු ගස | ............................... |
| vi. කාටිලේජවලින් සැදුම්ලත් සැකිලි පද්ධතියක් දරන | මෝරුන් හා මඩුවන් | ............................... |
| vii. මවගේ ස්‍රාවය වන කිරි බී වැඩෙන සතුන් | මිනිසා, හික්මීයා, වවුලා, ඩොල්ෆින්, අලියා | ............................... |
| viii. ජීවන චක්‍රයේ යම් කාලයක් ජලයේ ගත කරන ජීවීන් | ගෙම්බන්, මැඩියන්, හිරිදණ්ඩන් | ............................... |
| ix. බඩ ගා ගෙන ගමන් කරන සතුන් | සර්පයින්, කටුස්සන්, හූනන්, කබරගොයින්, ඉබ්බන්, කැස්බෑවුන් | ............................... |
| x. වර්ෂාපතනය අවම වසරේ වැඩි කලක් වියළි තත්ත්වයේ පවතින දේශගුණ ස්වභාවය | මන්නාරම හා හම්බන්තොට ප්‍රදේශ | ............................... |
| xi. ජුරාසික යුගයට අයත් ශාක ෆොසිල හමුවන තැන්පතු | ඉන්දියාවේ ශ්‍රී ලංකාවට සමගාමීව පිහිටා ඇති | ............................... |
| xii. ගංගා ඇළදොළ මගින් ප්‍රවාහනය වී තැන්පත් වුණු | මඩ, බොරලු හා සියුම් වැලි | ............................... |
| xiii. පාෂාණීභූත වූ | සතුන් හෝ ශාක, ජීවීන්ගේ කොටස්, සතුන්ගේ පාද සලකුණු, ශාක පත්‍රවල සටහන් | ............................... |
| xiv. ශ්‍රී ලංකාවේ භූ විද්‍යාත්මක ලක්ෂණ අතර කඳුකර පාෂාණ කාණ්ඩයට දෙපසින් පිහිටන පාෂාණ ආකාරය | ශ්‍රී ලංකාවේ බටහිර දෙසින් කුරුණෑගල සිට මාන්කුලම් දක්වාත් දකුණු සීමාවේ හම්බන්තොට සිට ත්‍රිකුණාමලය දක්වාත් | ............................... |
| xv. පුරාණ සම්භවයක් ඇති මල් හට නොගන්නා ශාක | මීවන ශාක | ............................... |

අස්ථික මසුන් ග්‍රැනයිට් කොටා තැන්පතු ක්ෂීරපායීන් උරගුන්

පර්ණාංග ෆොසිල දියලු තැන්පතු විජයානු සංකීර්ණය පෘෂ්ඨවංශීන්

උභය ජීවීන් ගොන්ඩ්වානා පද්ධති බහුසෛලික ජීවීන් කාටිලේජීය මසුන්

අර්ධ ශුෂ්ක දේශගුණික තත්ත්වය

## ක්‍රියාකාරකම් 3

1) දී ඇති මාතෘකාවල හිස්තැනට ගැළපෙන විශේෂණ පද වරහන් තුළින් තෝරන්න.

i. ................................... නටබුන් පිළිබඳ තොරතුරු සොයා අපි චාරිකාවේ යෙදුණෙමු.
ii. නාට්‍ය නරඹන ප්‍රේක්ෂකයන් ................................ කුල්මත් විය.
iii. කරදර පවතිද්දී ඔවුහු .............................. අත්වැල් බැඳගත්හ.
iv. ........................... පුද්ගලයින් සමාජයට ගැටලු සහගත දේ කරයි.
v. ........................... ගති ඇති දැරියන් යහපත් ජීවිත ගත කරති.
vi. එම වර්ණනා .............................. වර්ණනා වී ඇත.
vii. ............................ ලෝකයේ බබළන මුතු ඇටය මගේ මව්බිමයි.
viii. ............................ චිත්‍ර ඇඳීමට පාසල් සිසුහු උනන්දු වෙති.
ix. ඔහුගේ තාල වාද්‍ය නාදය ................................. අප කන් පිනවයි.
x. පවතින කාලගුණ තත්ත්වය හේතුවෙන් කැලණි ගඟේ ජල මට්ටම ................................ ඉහළ යයි.

| | | | | |
|---|---|---|---|---|
| අතිශයෝක්තියෙන් | මියුරු ලෙස | ශීඝ්‍රයෙන් | නිහතමානී | |
| පෙරදිග | කපටි | කලාත්මක | ප්‍රහසනයෙන් | පැරණි |
| සමගියෙන් | | | | |

## ක්‍රියාකාරකම් 4

1) පහත දී ඇති වාක්‍යවලට විරාම ලක්ෂණ නිවැරදි ව යොදන්න.

i. ඔබට සෝ තැවුල් නොම වේවා .....
ii. ඔහු ජනප්‍රිය ගායකයෙකි ...... ගීත රචකයෙකි.
iii. 3 ..... 5 අනුපාතයට සියලු මුදල් බෙදා දුනි.
iv. අහෝ ..... මිනිස්සු පීඩා විඳින්නේ ඇයි .....
v. ඔබට ..... ඔබ සැමට ...... ගෞරවයෙන් ඇරයුම් කරමි.
vi. ...... මම ගෙදර එන්නම් ..... යි මල්ලී කීවේ ය.
vii. ලංකාවේ ප්‍රධාන භෝග ලෙස තේ .... රබර් .... පොල් හැඳින්වේ ....
viii. වික්‍රමසිංහයන්ගේ .... ගම්පෙරළිය .... කලාත්මක නවකතාවේ ආරම්භය සනිටුහන් කරයි.
ix. දුම්රිය ගමන් කරන්නේ බෙලිඅත්තේ ..... අනුරාධපුරය දක්වා ය.
x. පු .... ලි .... දෙ .... මේ දිනවල කාර්යබහුල ය.

**<u>පිළිතුරු</u>**

## <u>ක්‍රියාකාරකම් 1</u>

1) වසර මිලියන 201 සිට 145 තෙක් කාලය
2) ලංකාව ද ඉන්දියාවේ ගිනිකොණ දිග වෙරළට යාබද ප්‍රදේශ
3) කාටිලේජ මසුන්, අස්ථික මසුන්, උභය ජීවීන්, උරගයින්, ක්ෂීරපායි සතුන්
4) ශ්‍රී ලංකාවේ වයඹ දිග පෙදෙසෙහි ප්‍රාග්කේම්බ්‍රීය සම්භවයක් ඇති විජයානු සංකීර්ණයේ වූ සානු තුළ
5) ඊ. ජේ. වේලන්ඩ්
6) ග්‍රැනයිට් හා නයිස් පාෂාණ
7) ඉන්දියාවේ දමෝදාහි පිහිටි රජ්මහල් තැන්පතු හා මදුරාසි ද්‍රෝණියේ තැන්පතුවලින් හමුවන ශාකවලින්
8) ආඬිගම පුරාසික තැන්පතුව
9) මධ්‍යම හා පහළ පුරාසික තැන්පතු අවධිය
10) 1924
11) පී. ඊ. පී. දැරණියගල
12)
    - ශ්‍රී ලංකාවේ ගොඩ්වානා තැන්පතු
    - ශ්‍රී ලංකාවේ ඇතැම් උද්භිත විද්‍යාත්මක ෆොසිල
13) රජ්මහල් තැම්පතුව
14) ආර්. වී. සිතෝලි
15) ඉන්දියාවේ පුරාණ උද්භිද විද්‍යාව

## <u>ක්‍රියාකාරකම් 2</u>

1) .
    i. C
    ii. F
    iii. E
    iv. B
    v. A
    vi. J
    vii. D
    viii. I
    ix. H
    x. G

2) .

i. ග්රැනයිට්
ii. ගොන්ඩ්වානා පද්ධති
iii. අස්ථික මසුන්
iv. පෘෂ්ඨවංශීන්
v. බහුසෛලික ජීවීන්
vi. කාටිලේජීය මසුන්
vii. ක්ෂීරපායීන්
viii. උභය ජීවීන්
ix. උරගුන්
x. අර්ධ ශුෂ්ක දේශගුණික තත්ත්වය
xi. කොටා තැන්පතු
xii. දියලූ තැන්පතු
xiii. ෆොසිල
xiv. විජයානු සංකීර්ණය
xv. පර්ණාංග

## ක්‍රියාකාරකම් 3

1) .

i. පැරණි
ii. ප්‍රහසනයෙන්
iii. සමගියෙන්
iv. කපටි
v. නිහතමානී
vi. අතිශෝක්තියෙන්
vii. පෙරදිග
viii. කලාත්මක
ix. මියුරු ලෙස
x. ශීඝ්‍රයෙන්

## ක්‍රියාකාරකම් 4

1) .

i. !
ii. ;
iii. :
iv. ! ?
v. / /
vi. “ ”
vii. , , .

viii. ‘ ’
ix. -
x. . . .